# බටහිර නීතිය හා විද්‍යාව ගැන අත්දැකීම්

පසුගිය සති කිහිපයෙහි බ්‍රිතාන්‍යයෙහි හා නෙදර්ලන්තයෙහි සිදුවීම් කිහිපයක් අප ගෙනහැර දක්වන්නේ එහි ලංකාවට ඇති අදාළත්වය ගැන ද සැලකිලිමත් වෙමිනි. නේස්බි සාමිවරයා නමින් හැඳින්වෙන සාමිවරයකු කියා තිබුණේ කොටි සංවිධානයේ තහනම නිසි ලෙස ක්‍රියාත්මක කරවීමට බ්‍රිතාන්‍යය ප්‍රමාණවත් වැඩ කොටසක් නොකරන බවය. ඔහු සන්ඩේ අයිලන්ඩ් පුවත්පත සමඟ කළ සාකච්ඡාවකදී තවදුරටත් කියා තිබුණේ බ්‍රිතාන්‍ය පුරවැසියකු වූ ඇන්ටන් බාලසිංහම්ට කොටි සංවිධානය ඉදිරියට ගෙන යෑමට කටයුතු කිරීමට විශේෂ අයිතියක් නැති බවත්, බාලසිංහම් දිගටම එසේ කරන්නේ නම් එහි ප්‍රතිවිපාක විඳීමට ඔහු සූදානම්ව සිටිය යුතු බවත්ය. මේ අතර නෙදර්ලන්ත පුවත්පතක් කොටි සංවිධානයේ මුදල් එකතුකිරීම් ගැන වාර්තා කර තිබිණි. මේ කරුණු අප නොදැන සිටි දෑ නොවෙයි. මෙරට දෙමළ ජාතිවාදය ආරම්භ කළෝ ලන්දේසීහු ය. එදා ඔවුන් පැමිණි ඕලන්දය නම් රට අද හැඳින්වෙන්නේ නෙදර්ලන්තය ලෙසින්ය. ලන්දේසීන් ආරම්භ කළ දෙමළ ජාතිවාදය පෝෂණය කර හදාවඩා ගනු ලැබුයේ බ්‍රිතාන්‍යය විසින් ය. නේස්බි සාමිවරයාගේ ප්‍රකාශයෙන් හා නෙදර්ලන්ත පුවත්පතක පළ වූ වාර්තාවෙන් කියවෙන්නේ මේ රටවල් දැන් තම ප්‍රතිපත්ති වෙනස් කර ඇති බව නොවෙයි. ඒ රටවල ඉතාම සුළුතරයක මතයක් ඒ පුවත්වලින් කියැවෙයි. කෙසේ වෙතත් නේස්බි සාමිවරයා තම ප්‍රකාශය කර තිබුණේ එරට පුවත්පතකට නොව ලංකාවේ පළවන සන්ඩේ අයිලන්ඩ් පුවත්පතටය. බ්‍රිතාන්‍යයේ පුවත්පත් ඔහු හමු වී සාකච්ඡා ලබා ගන්නේ යැයි සිතිය නොහැකිය.

බ්‍රිතාන්‍යය කොටි සංවිධානය තහනම මගින් කරන්නේ බොරුවක් බව අප කලක සිටම කියා ඇත. ඇමරිකා එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යය කොටි තහනම් කළේ ලංකාවේ ප්‍රශ්නය නිසා යැයි විශ්වාස කිරීමට අපි බොහෝ දෙනෙක් කැමැත්තෙමු. එහෙත් ඒ රටවල් කොටි සංවිධානය තහනම් කර ඇත්තේ මූලික වශයෙන් ම ඇමරිකා එක්සත් ජනපදයට තර්ජනයක් වූ අරාබි සංවිධාන කිහිපයක් සමඟ කොටි සම්බන්ධකම් ඇතිකර ගෙන සිටින බැවිනි. එවැනි වෙනත් සංවිධාන තහනම් කරන විට කොටි සංවිධානය තහනම් නොකර සිටීමට නොහැකි බැවින් ඇමරිකාවට කොටි තහනම් කිරීමට සිදු වී ඇත. ඇන්ටන් බාලසිංහම් බ්‍රිතාන්‍යයේ (පණ්ඩිතයන්ට අවශ්‍ය නම් එක්සත් රාජධානියේ) පුරවැසියෙකි. බ්‍රිතාන්‍යයේ තහනම් කර ඇති කොටි සංවිධානයේ ඊනියා න්‍යායාචාර්යවරයා ඔහු වෙයි. ඔහු බ්‍රිතාන්‍යයේ, විශේෂයෙන්ම ලන්ඩනයෙහි කොටි සංවිධානයෙහි

රැස්වීම්වල කතා කරයි. මේ රැස්වීම් කොටි සංවිධානයේ නමින් නොපවත්වන බව සැබෑය. එහෙත් බ්‍රිතාන්‍ය ඔත්තු සේවය හා පොලිසිය ඒ රැස්වීම් සංවිධානය කරනු ලබන්නේ කවුරුන් විසින් දැයි නොදැන සිටිනවා විය නොහැකිය. එපමණක් නොවෙයි. වෙනත් රටවල කොටි සංවිධානය නියෝජනය කිරීමට බාලසිංහම් යන්නේ ලන්ඩනයේ සිටය. ඔහු ප්‍රභාකරන් හමුවීමට ලංකාවට එන්නේ ද ලන්ඩනයේ සිට ය. බ්‍රිතාන්‍යය බාලසිංහම් අත්අඩංගුවට ගත යුතුව තිබුණේ බොහෝ කලකට පෙරය. එහෙත් එසේ අත්අඩංගුවට නොගැනුණි. මෙරට දෙමළ ජාතිවාදය පෝෂණය කර හදාවඩා ගත් බ්‍රිතාන්‍යය නේස්බි සාමිවරයා හෝ වෙනත් අයකු කී පමණින් කොටින්ට හෝ බාලසිංහම්ට හෝ කිසිවක් නොකරනු ඇත. බටහිර යුරෝපයේ ක්‍රිස්තියානි රටවල හා උතුරු ඇමරිකාවේ කොටි සංවිධානයට විපක්ෂ කිහිපදෙනෙකු සිටින බව සැබෑය. එහෙත් එවැන්නන් සිටින බව ඒ රටවල ජීවත්වන්නන්ට වඩා අපි දනිමු. එවැන්නන්ට ඒ රටවල එතරම් ප්‍රසිද්ධියක් නොලැබෙයි. ඒ රටවල පුවත්පත් කිහිපයක් ද කොටි සංවිධානයට විරුද්ධය. එහෙත් ජනමාධ්‍යවලින් අති විශාල බහුතරය ඇත්තේ කොටි සංවිධානය සමඟය. විශේෂයෙන්ම අපක්ෂපාතී යැයි පෙන්වීමට විශාල උත්සාහයක් ගන්නා බීබීසිය කොටි සංවිධානය සමඟය.

ඒ රටවල ජනතාවගෙන් විශාල බහුතරය ලංකාවේ දෙමළ ජාතිවාදය පිළිබඳ කිසිවක් නොදනියි. ඇමරිකාවේ නම් බහුතරය ලංකාව ගැන ද නොදනියි. ඒ රටවල ලංකාව ගැන දන්නා කිහිපදෙනා දන්නේ ජනමාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වන කරුණු පමණය. ඒ රටවල ජනමාධ්‍ය හා දේශපාලනඥයන් ඉතා වැඩි වශයෙන් ප්‍රචාරය කරන්නේ ඔවුන්ගේ දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික යටත්විජිතවාදය තහවුරු කිරීමට අවශ්‍ය දේ බව නොදන්නා පිරිසක් අපේ රටවල ඇත්නම් ඒ බීබීසිය වැනි ආයතනවල අගුපිල්වල සේවය කරන සංදේශකරුවන්, මෙරට ඇතැම් විශ්වවිද්‍යාල

© Prof. Nalin De Silva

ආචාර්ය මහාචාර්යවරුන්, රාජ්‍ය නොවන සංවිධානවලට බැල මෙහෙකම් කරන ඊනියා උගතුන් ආදීන්ය. ඔවුන් ද කරන්නේ එකී යටත්විජිතවාදී මතවාද තහවුරු කිරීම පමණය. බටහිර ක්‍රිස්තියානි යටත් විජිතවාදය විසින් ප්‍රචාරය කෙරෙන්නේ ඔවුන් මෙරට දෙමළ ජාතිවාදයක් ඇති කර ඒ පෝෂණය කළ බව නොවෙයි. ඔවුන් එදත් අදත් ප්‍රචාරය කරන්නේ මෙරට දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම මහත් අසාධාරණයක් වී ඇති බවය. ඒ අසාධාරණය කුමක් දැයි ඇසූ කල ඔවුහු නිහඬ වෙති. එසේත් නැතහොත් සිංහල දෙමළ කෝළාහළ පිළිබඳව දොඩවති. ඒ කෝළාහළවලින් සිංහලයන්ට ද හිරිහැර වූ බව ඔවුන්ට අමතකය. එපමණක් නොව අද ලංකාවේ ඕනෑම ප්‍රදේශයක දෙමළ මිනිසකුට පදිංචි විය හැකි වුවද සිංහලයකුට උතුරට යෑමට බැරි බව ඔවුහු නොකියති.

දෙමළ ජනයාට සිංහලයන්ගෙන් විශාල අසාධාරණයක් වී යැයි කෑගසන බීබීසීය මේ ළඟදී වැදගත් පුවතක් ප්‍රචාරය කළේය. බංග්ලාදේශයේ සිට බ්‍රිතාන්‍යයට පැමිණ ඇති මුස්ලිම් දෙමව්පියන්ගේ දියණියක වූ ෂබීනා බෙගම් දැරිය තම පාසලට මුස්ලිම් ඇඳුමින් සැරසී ගිය විට පාසලින් ඒ නැවැත්විණි. එවිට දැරිය එරට අභියාචනා අධිකරණයට ගියාය. අභියාචනාධිකරණය දැරියගේ පාසල දැරියට තම ආගම විද්‍යමාන කිරීමට ඇති අයිතිය නැති කළේ යැයි තීරණය කෙළේය. එවිට පාසල් සාම් මන්ත්‍රී මණ්ඩලයේ සාමිවරුන්ගේ අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළාය. එහිදී තීරණය වූයේ පාසල මුස්ලිම් විශ්වාසයට ගරු කරමින් ශිෂ්‍යාවන් සම්බන්ධයෙක් ඒකාකාර පිළිවෙතක් අනුගමනය කිරීමට මහත් වෙහෙසක් දරා ඇති බවය. ඒ තීන්දුව අනුව දැරියට පාසල විසින් නියම කර ඇති ඇඳුම (යුනිෆෝමය) ඇඳීමට සිදු වී ඇත. මේ ප්‍රවෘත්තිය ප්‍රචාරය කළ බීබීසිය ඒ ඉදිරිපත් කර ඇත්තේ පාසලට අගතියක් නොවන අයුරින්ය. යම්කිසි අයුරකින් ලංකාවේ පාසලක සිංහල විදුහල්පතිනියක් මුස්ලිම් දැරියකට මුස්ලිම් ඇඳුමින් සැරසී පාසලට පැමිණීම තහනම් කළේ යැයි සිතමු. ඒ සම්බන්ධයෙන් පවරන ලද නඩුවක තීරණය පාසල නිවැරදි යැයි කීවා යැයි සිතමු. එවිට අගුපිල් සංදේශකාරයන් කරනු ඇත්තේ කුමක්ද? ලංකාවේ අධිකරණයේ ජාතිවාදී දෘෂ්ඨිය, සිංහල බෞද්ධ අධිපතිවාදය ගැන නන් දෙඩවීම පමණය. එවැනි අවස්ථාවකදී ලංකාවේ දී වුව සිදුවන්නේ ගවුමක් යැයි කියැවෙන ඇඳුමින් සැරසී පාසලට පැමිණෙන ලෙස නියම කිරීමය. ගවුම සිංහල බෞද්ධ අධිපතිවාදය නියෝජනය කරන්නේ කෙසේද යන්න බීබීසී අගුපිලේ නිදාගන්නා අයගෙන් හා ඊනියා ප්‍රබුද්ධ ජනමාධ්‍යකරුවන් නමින් පෙනී සිටින ජඩමාධ්‍යකරුවන්ගෙන් අසා දැන ගත යුතුය. ලංකාවේ එවැන්නක් සිදුවුවත් එහිදී තහවුරු වන්නේ ද බ්‍රිතාන්‍යයේ මෙන්ම යුරෝපීය ක්‍රිස්තියානි ඇඳුම වූ ගවුම ම බව මේ ජඩමාධ්‍යවලට නොතේරෙන්නේ ඔවුන්ගේ ගැති බව හේතු කොටගෙනය.

දැනට ටික කලකට පෙර බදුල්ලේ දෙමළ පාසලකට මුස්ලිම් ඇඳුමින් සැරසී පැමිණි දැරියකට දෙමළ විදුහල්පතිනිය තහංචි පැනවූ බව අපට මතකය. ඒ අවස්ථාවේදී මානව අයිතිවාසිකම් වෙනුවෙන් කතා නොකෙරිණි. අප තේරුම් ගත යුතු කරුණ නම් මෙරට මානව අයිතිවාසිකම් නැති පිරිසක් වේ නම් ඒ සිංහල බෞද්ධයන් බවය. දැරියකට කොළඹ කාන්තා විද්‍යාලයට හෝ බිෂොප් විද්‍යාලයට හෝ ළමා සාරියකින් සැරසී පැමිණීමට කොළඹ බිෂොප්තුමාගෙන් අවසර ලැබේද? එවැනි අවස්ථාවක් උද්ගත වුවහොත් මෙරට ඊනියා උගතුන් සාරිය හඳුන්වා දුන්නේ ධර්මපාල තුමා යැයි කියමින් ආගම්වාදී ජාතිවාදයක් හඳුන්වාදීම ගැන එතුමාට දොස් පවරනු ඇත්තේ තම සංස්කෘතික යටත්විජිතවාදී ගැති බව විද්‍යමාන කරමිනි. බ්‍රිතාන්‍ය සාම් මණ්ඩලයේ විනිසුරුවන් දී ඇති තීන්දුවෙන් පැහැදිලි වන්නේ මානව අයිතිය, ආගමික නිදහස ආදිය ගැන මොන බයිලා කීව ද බටහිර රටවලත් ලංකාව වැනි රටවලත් ඇත්තේ ක්‍රිස්තියානි මානව අයිතියක් පමණක් බවය. බ්‍රිතාන්‍ය විනිසුරුවෝ ඇංග්ලිකන් සංස්කෘතියේ ආරක්ෂකයෝ වෙති.

ඇංග්ලිකන් සංස්කෘතියෙහි ආරක්ෂකයන් වන්නේ ඒ විනිසුරුවන් පමණක් නොවෙයි. පසුගියදා කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය ටෙම්පල්ටන් ත්‍යාගය පිරිනැමුවේ මහාචාර්ය ජෝන් බැරෝටය. විශ්වවේදියකු (කොස්මොලොජිස්ට්) වූ මහාචාර්ය බැරෝ සසෙක්ස් විශ්වවිද්‍යාලයේ තාරකා විද්‍යා මහාචාර්යවරයකුව සිටි කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයෙහි ගණිත ආයතනයෙහි අධ්‍යක්ෂ වීම සඳහා එහි ගියේය. කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය ටෙම්පල්ටන් ආයතනය සමග එකතු වී ආගම හා විද්‍යාව පිළිබඳ ලියන රචනයකට ටෙම්පල්ටන් නමින් වාර්ෂික ත්‍යාගයක් පිරිනමයි. මෙහිදී කෙරෙන්නේ ක්‍රිස්තියානි ආගම හා බටහිර විද්‍යාව අතර සම්බන්ධය තහවුරු කිරීමය. බැරෝ හා වෙනත් අය ඉදිරිපත් කරන මතවාදයකට අනුව විශ්වය නිර්මාණය කෙරී ඇත්තේ බුද්ධිමත් නිරීක්ෂකයන්ට ඒ නිරීක්ෂණය කිරීමටය. එහි අවසානයේ ඇත්තේ දේව නිර්මාණවාදයය. බටහිර විද්‍යාවේ ඉහළින්ම ඇත්තේ භෞතික විද්‍යාවය. එහිද ඉහළින්ම ඇත්තේ සාධාරණ

© Prof. Nalin De Silva

සාපේක්ෂතාවාදය හා ක්වොන්ටම් භෞතිකය ය. මේ විද්‍යාවන් එදත් අදත් ක්‍රිස්තියානි සංස්කෘතියක නිර්මාණය වන බව බටහිර විද්‍යාව ගැන මෙලෝ හසරක දැනුමක් නැති මෙරට ඊනියා උගත්තු කෙසේ දනිත්ද? අපේ නොවන විද්‍යාවක් අපේ නොවන නීති පද්ධතියක් බදාගෙන නිදහස් වීමට අප දරන ප්‍රයත්නය ගඟට ඉණි කැපීමකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva